# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
**UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA**

මගේ අංකය
My Number }

ඔබේ අංකය
Your Number }

නුගේගොඩ
ශ්‍රී ලංකාව.

NUGEGODA
SRI LANKA.

තැපැල්පෙට්ටිය - 6 - නුගේගොඩ.
Post office box - 6 - Nugegoda.

# දැන්වීමයි

## මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

### සංගීතය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව (Uni - code 068C)

**විශ්වවිද්‍යාල ප්‍රවේශය 2023/2024 අධ්‍යයන වර්ෂය (2023 අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල මත)**

**යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම**

2023 වර්ෂයේ පැවති අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණයේ ප්‍රතිඵල මත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති බවට නිවේදනය කරනු ලැබ ඇති අපේක්ෂකයන්ගෙන් යෝග්‍යතා පරීක්ෂණය සඳහා **2024.07.25 දින සිට අයදුම්පත් කැඳවනු ලැබේ.**

**අයදුම් කිරීමේ දී උත්තර භාරතීය රාගදාරී සංගීතය ගායනය, වයලීන, සිතාර්, තබ්ලා යන විෂයයන්ගෙන් එකක් ප්‍රධාන විෂයය ලෙස හැදෑරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන් පමණක් මෙම පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ය. යෝග්‍යතා පරීක්ෂණය පවත්වනු ලබන්නේ උත්තර භාරතීය රාගදාරී සංගීතය සඳහා පමණි.**

1. ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම්,

   (i.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබ ඇති "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය, අධ්‍යයන වර්ෂය 2023/2024 අ.පො.ස (උ/පෙළ) 2023" ශිෂ්‍ය අත්පොතට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් සපුරා තිබීම.

   සහ

   2023 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී සංගීත විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිතව පෙනී සිටි විෂයයන් තුනෙන්ම සමත් වී තිබීම.

   (ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය ඉහත කී අවම සුදුසුකම් සපුරා ඇති සිසුන් ඊට අමතරව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් වීම.

2.අයදුම් කළ යුතු ආකාරය:

අයදුම්කරුවන් පහත සඳහන් සබැඳිය (Link) http://fhss.sjp.ac.lk/mct/aptitude-test/ ඔස්සේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයෙහි වෙබ් අඩවියෙහි පළකර ඇති අයදුම්පත මාර්ගගත ක්‍රමයට (Online) සම්පූර්ණ කොට 2024.08.10 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු ය.

යෝග්‍යතා පරීක්ෂණය සඳහා රු.2000.00ක ගාස්තුවක් අය කරනු ලැබේ. එම ගෙවීම මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් මූල්‍යාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නමින් මහජන බැංකුවේ ගංගොඩවිල ශාඛාවේ ඇති ගිණුම් අංක 097-1-00150005005 දරන ගිණුමට බැරවන පරිදි ගෙවිය යුතු ය. ගෙවීම් වවුචරයෙහි පැහැදිලිව අපේක්ෂකයාගේ නම සහ හැඳුනුම්පත් අංකය සටහන් කර තිබිය යුතු ය. ඊට අමතරව එම වවුචරයෙහි යෝග්‍යතා පරීක්‍ෂණය - සංගීතය ලෙස සටහන් කළ යුතුය. වෙනත් ආකාරයකින් සිදුකරන ගෙවීම් වලංගු නොවේ.

අයදුම්කරුවන් පහත සඳහන් ලේඛන අයදුම්පත සමග අදාළ පරිදි උඩුගත (Upload ) කළ යුතු අතර ඒවායේ මුල් පිටපත් යෝග්‍යතා පරීක්ෂණයට පැමිණෙන දිනයේ අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු ය.

i. මහජන බැංකුවට මුදල් ගෙවන ලද ලදුපත
ii. ජාතික හැඳුනුම්පත
iii. 2022 අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල ලේඛනය (පාසල් අයදුම්කරුවෙකු නම්, විදුහල්පති හෝ පෞද්ගලික අයදුම්කරුවෙකු නම්, ග්‍රාමසේවා නිලධාරී විසින් සහතික කළ යුතු ය.)

3. මූලික සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ හෝ සාවද්‍ය තොරතුරු ඇතුළත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි අවස්ථාවකදී අයදුම්කරුවන් ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

4. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී සංගීතය ගෞරව උපාධිය සඳහා යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින සියලුම සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ද අයදුම් කළ යුතුය.

5. මෙම යෝග්‍යතා පරීක්ෂණයට අදාළ වැඩිදුර තොරතුරු විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ http://fhss.sjp.ac.lk/mct/aptitude-test/ වෙබ් අඩවියෙහි පළ කරනු ඇත.

එසේම පරීක්ෂණයට අදාළ තොරතුරු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ විද්‍යුත් තැපැල (Email) වෙත පමණක් දන්වනු ලබන අතර තැපැල් මගින් දන්වනු නොලැබේ. මෙම යෝග්‍යතා පරීක්ෂණය සිංහල මාධ්‍යයෙන් (හෝ අවශ්‍යතාව මත ඉංග්‍රීසි මාධ්‍යයෙන්) පමණක් පැවැත් වේ .

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

දුරකථනය / Telephone } 2802695,2802696,2803191 2803192,2801024,2801025 2802022,2802023
Fax / ෆැක්ස් } 2801604
E.Mail } unisj@sjp ac.lk